# ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය

# (NBRI)

## ආරක්ෂක අමාත්‍යාංශය

# ටෙන්ඩර් සඳහා ආරාධනයයි

### ස්ථායිකරන ක්‍රමවේද මගින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය (RLVMMP)

### අරමුදල් යෙදවීම : ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) සහ ශ්‍රී ලංකා රජය (GOSL)

### ණය අරමුදල් අංක : L0124A

01. ශ්‍රී ලංකා රජය විසින්, ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) වෙතින්, ස්ථායිකරන ක්‍රමවේද මගින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතියෙහි (RLVMMP) පිරිවැය සඳහා දැනටමත් මුදල් යෙදවීමක් ලබාගෙන ඇති අතර, ඉන් කොටසක්, මාතලේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයන්හි පහත දැක්වෙන නායයෑමේ අවදානම අවම කිරීමේ පැකේජ යටතේ වන ගෙවීම් සඳහා යෙදවීමට අපේක්ෂිතය. හඳුනාගත් පැකේජයන්හි ඇස්තමේන්තුගත පිරිවැය පහත දක්වා ඇත.

02. ඒ අනුව, ආරක්ෂක අමාත්‍යාංශය වෙනුවෙන්, ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, සුදුසුකම්ලත් ටෙන්ඩර්කරුවන් වෙතින්, ඉහත කාර්යය සඳහා මුද්‍රා, තැබූ ටෙන්ඩර් කැඳවනු ලැබේ. පැකේජ 10V සහ 10W සඳහා ඉදිකිරීම් කාලය ලිත් දින 150ක් වන අතර, 10X පැකේජය සඳහා ඉදිකිරීම් කාලය ලිත් දින 270කි. දෝෂ වගකීම් කාලය **දින 365 වේ.**

| අංක | කොන්ත්‍රාත් අංක | කාර්ය විස්තරය | ඇස්තමේන්තුගත පිරිවැය (VAT හැර) (ලං. රු.) | CIDA ලියාපදිංචිය | ආපසු නොගෙවන ගාස්තු (ලං. රු.) | ටෙන්ඩර් සුරක්ෂණයේ වටිනාකම (ලං.රු.) සහ වලංගු කාලය |
|---|---|---|---|---|---|---|
| 01 | RLVMMP/ WORKS/ 10V | ස්ථායිකරන ක්‍රමවේද මගින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතියෙහි (RLVMMP) 10V පැකේජය යටතේ මාතලේ දිස්ත්‍රික්කයෙහි ප්‍රධාන දුම්රිය මාර්ගයෙහි (වත්තේගම සිට උකුවෙල දක්වා) දිට්වා සුළි කුණාටුව හේතුවෙන් හානි වූ ස්ථාන 04ක් (පරිශ්‍ර අංක 250, 251, 252, 253) සඳහා අවදානම අවම කිරීමේ සැලසුම් | මිලියන 600 | C3 හෝ ඉහළ | 66,000.00 | ලං. රු. මිලියන 9 ක් හෝ ඇමරිකානු ඩොලර් 26,865.00 2027.05.05 දක්වා වලංගු |
| 02 | RLVMMP/ WORKS/ 10W | ස්ථායිකරන ක්‍රමවේද මගින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතියෙහි (RLVMMP) 10W පැකේජය යටතේ මාතලේ දිස්ත්‍රික්කයෙහි ප්‍රධාන දුම්රිය මාර්ගයෙහි (වත්තේගම සිට උකුවෙල දක්වා) දිට්වා සුළි කුණාටුව හේතුවෙන් හානි වූ ස්ථාන (පරිශ්‍ර අංක 204 සඳහා අවදානම අවම කිරීමේ සැලසුම් | මිලියන 425.5 | C3 හෝ ඉහළ | 54,000.00 | ලං. රු. මිලියන 6ක් හෝ ඇමරිකානු ඩොලර් 17,910.00 2027.05.05 දක්වා වලංගු |
| 03 | RLVMMP/ WORKS/10X | ස්ථායිකරන ක්‍රමවේද මගින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතියෙහි (RLVMMP) 10x පැකේජය යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයෙහි ප්‍රධාන දුම්රිය මාර්ගයෙහි (නානු ඔය සිට අඹේවල දක්වා) දිට්වා සුළි කුණාටුව හේතුවෙන හානි වූ ස්ථාන 06ක් (පරිශ්‍ර අංක 255, 256, 257, 258, 259, 260) සඳහා අවදානම අවම කිරීමේ සැලසුම් | මිලියන 425 | C3 හෝ ඉහළ | 54,000.00 | ලං. රු. මිලියන 6ක් හෝ ඇමරිකානු ඩොලර් 17,910.00 2027.05.05 දක්වා වලංගු |

03. කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරුවා අසාධු ලේඛනගත වූවෙකු නොවිය යුතු අතර, AIIB බැංකුව සහ/ හෝ ශ්‍රී ලංකා රජය විසින් තහනම් කළ අයකු නොවිය යුතු අතර, පහත සඳහන් අවශ්‍යතා සපුරාලිය යුතුය.

    a.) දේශීය ටෙන්ඩර්කරුවන්, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (සීඩා/ ඉක්ටැඩ්) (පෙර ඉක්ටැඩ් ලෙස හැඳින්වූ) ගොඩනැගිලි ඉදිකිරීම් හෝ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයන්හි ඉහත සඳහන් ශ්‍රේණියෙහි ලියාපදිංචි ලැබූ සහ වලංගු ලියාපදිංචියක් සහිත කොන්ත්‍රාත්කරුවන් විය යුතු අතර, සහ

    b.) යම් විදේශ කොන්ත්‍රාත්කරුවකුහට, ප්‍රධාන/ නියමු පාර්ශ්වය ලෙස යම් "ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක්" සිදුකිරීමට අවශ්‍ය වෙතොත්, කොන්ත්‍රාත්තුව සාර්ථකව ප්‍රදානය කිරීම සඳහා "තාවකාලික ලියාපදිංචි සහතිකයක්" ඔහු සඳහා ලබාගත යුතුය.

    මේ සඳහා කරුණාකර, 2018-08-23 දිනැති අංක 2085/19 දරන ගැසට් පත්‍රයේ "විදේශ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම" ශීර්ෂය වෙත යොමුවන්න. මෙය, www.documents.gov.lk වෙතින් බාගත කළ හැකි අතර, වැඩිදුර විස්තර www.cida.gov.lk වෙතින් ලබාගත හැක.

04. මෙම ටෙන්ඩර්කරණය, ජාතික තරගකාරී ටෙන්ඩර්කරණ ක්‍රියාපටිපාටිය (NCT) තුළින්, AIIB, බැංකුවේ, 2016 ජූනි 2 දිනැති අන්තර් මෙහෙයුම් නියෝගයෙහි නිර්දිෂ්ට ටෙන්ඩර් සඳහා ඉල්ලීමයි. (RFT) භාවිතයෙන් පවත්වනු ලැබේ.

05. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ජාත්‍යන්තර හා දේශීය ටෙන්ඩර්කරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, **ව්‍යාපෘති අධ්‍යක්ෂ** - RLVMMP **(දුරකථනය : 0112-559869)** වෙතින් ලබාගත හැකි අතර, අදාළ ටෙන්ඩර් ලේඛන, **කොළඹ 05, ජාවත්ත පාරේ, අංක 99/1, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේදී,** රාජකාරී දිනවල, **2026.10.20 දින සිට 2026.11.06 දින දක්වා** කාර්යාල වේලාවන් තුළදී **09.00 පැය හා 14.00 පැය** අතර කාලය තුළ පරීක්ෂා කොට බැලිය හැක. එසේම, ටෙන්ඩර් ලේඛන **2026.10.20 දින සිට 2026.11.06 දින දක්වා,** https://rlvmmp.lk වෙතින්ද පරීක්ෂා කොට බැලිය හැක. වෙබ් අඩවියෙන් බාගත කළ ටෙන්ඩර් ලේඛන, ඉදිරිපත් කිරීමට/ ටෙන්ඩර් කිරීමට භාර ගනු නොලැබේ.

06. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට අවශ්‍ය ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ ටෙන්ඩර් ලේඛන, උනන්දුවක් දක්වන ටෙන්ඩර්කරුවන්හට, අදාළ ටෙන්ඩර් ලේඛන ඉල්ලුම්කොට ඉල්ලීම් ලිපියක් ව්‍යාපාර ලිපි ශීර්ෂයක් මගින්, **අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය** (NBRI)**, අංක 99/1, ජාවත්ත පාර, කොළඹ 05** යන ලිපිනයට යොමු කිරීමෙන් හා ඉහත වගුවේ සඳහන් පරිදි ආපසු නොගෙවන ගාස්තු ගෙවීමෙන්, **2026.10.20 දින සිට 2026.11.06** දින දක්වා මිලදී ගත හැක.

07. ගෙවීම් NBRI ආයතනයේ අයකැමි වෙත මුදලින්ම කළ යුතුවේ.

08. තවද, ටෙන්ඩරය සමග ඉදිරිපත් කිරීමට අවශ්‍ය PCA 3 සහතිකය ලබාගැනීම සඳහා සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත, www.drc.gov.lk මාර්ගගත ක්‍රමවේදය මගින් ලියාපදිංචිවීම අවශ්‍ය වේ. අදාළ ලියාපදිංචිවීමේ ක්‍රමවේදය, eroc.drc.gov.lk වෙබ් අඩවි තුළින් මාර්ගගත ක්‍රමවේදයකට මාරු කොට ඇත.

09. මේ සම්බන්ධව, වැඩබිම් චාරිකාවක්, එක් එක් ටෙන්ඩර් ලේඛනයක ITT 7.4 හි නියමිත පරිදි 10V සහ10W පැකේජ සඳහා 2026.10.26 දින සහ පැකේජ 10X සඳහා **2026.10.27** දින ආරම්භ වීමට නියමිත අදාළ පෙර-ටෙන්ඩර් රැස්වීම, **2026.10.28 දින 10.00 පැයට, කොළඹ 05, ජාවත්ත පාරේ, අංක 99/1, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ ශ්‍රවණාගාරයේදී** පැවැත්වීමට නියමිතය.

10. සියලුම ටෙන්ඩර් සමග, ඉහතින් සඳහන් පරිදි, ටෙන්ඩර් සුරක්ෂණයක් තිබිය යුතු අතර, ටෙන්ඩර් සුරක්ෂණය, ශ්‍රී ලංකා මහබැංකුව විසින් අනුමත කළ වාණිජ බැකුවක් විසින් නිකුත් කළ, ටෙන්ඩර් ලේඛනයන්හි IV කොටසේ සඳහන් ආකෘතියෙන් යුත් කොන්දේසි විරහිත ඇපකරයක් විය යුතුය. අදාළ ටෙන්ඩර් ඇපකර වෙනත් රටක ස්ථාපිත බැංකුවක් මගින් නිකුත් කළ එකක් වෙතොත්, එය, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක අනුරූප බැංකුවක් විසින් සහතික කොට තිබිය යුතු අතර, ටෙන්ඩර් ලේඛනවල IV කොටසේ සඳහන් ආකෘතියෙන් යුක්ත විය යුතුය.

11. ටෙන්ඩර් ලේඛනයන්හි සියලුම පිටු ලංසුකරු විසින් අත්සන් කොට තම මුද්‍රාව තබා තිබිය යුතුය.

12. ටෙන්ඩර්, පිටපත් දෙකක් වශයෙන් 'මුල් පිටපත' හා 'අනුපිටපත' ලෙසට සකස් කොට, වෙන් වශයෙන් වූ කවරවල බහා ඒවායේ එසේ සඳහන් කොට, එම කවර යළි මුද්‍රා, තැබූ තනි කවරයක බහා එහි වම් ඉහළ කෙළවරේ කාර්ය විස්තරය හා ටෙන්ඩර් අංකය සඳහන් කොට ඉදිරිපත් කළ යුතුය.

13. සම්පූර්ණ කළ ටෙන්ඩර් පහත සඳහන් ලිපිනය වෙත, **2026.11.06 දින 14.00 පැයට** පෙර ලැබීමට සැලැස්විය යුතුය. ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීම/ භාරගැනීම සඳහා අවසර නොමැත. ප්‍රමාදවී ලැබෙන ටෙන්ඩර් භාර නොගෙනම ප්‍රතික්ෂේප කෙරේ. ලැබී ඇති ටෙන්ඩර් අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම, පහත සඳහන් ලිපිනයේදී, පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ පත්කළ නියෝජිතයන්ගේ හෝ එසේ බලයලත් ඕනෑම අයෙකුගේ ඉදිරියේ විවෘත කරනු ලැබේ.

14. ඉහතින් යොමු කළ ලිපිනය වනුයේ - ව්‍යාපෘති අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, ස්ථායිකරන ක්‍රමවේද මගින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, අංක 99/1, ජාවත්ත පාර, කොළඹ 05, ශ්‍රී ලංකාව.

**වෙනුවෙන් :**
**ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ (PPC) සභාපති,**
**ස්ථායිකරන ක්‍රමවේද මගින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය (RLVMMP).**